විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව

ஓய்வூதியத் திணைக்களம்
DEPARTMENT OF PENSIONS

ශ්‍රී ලංකා විශ්‍රාම
இலங்கை ஓய்வு
Sri Lanka Pensions

පරපුරක අභිමානය | தலைமுறையொன்றின் பெருமிதம் | Pride of a Generation

මගේ අංකය / எனது இல. / My No. } විශ්‍රාම වැටුප් උපදෙස් ලිපි 08/2022

ඔබේ අංකය / உமது இல. / Your No. } ..........................

දිනය / திகதி / Date } 2022.12.13

සියලුම ප්‍රාදේශීය ලේකම්වරුන් වෙත,

<u>විශ්‍රාම වැටුප් කළමනාකරණය</u>

විශ්‍රාම වැටුප් අනුමත කර ගෙවීම් ආරම්භ කිරීමෙන් පසු විශ්‍රාම වැටුප් කළමනාකරණය සඳහා පහත උපදෙස් අනුව කටයුතු කරන ලෙස කාරුණිකව දන්වමි.

**1. විශ්‍රාම වැටුප් සක්‍රිය කිරීමේ සම්මුඛ පරීක්ෂණය**

1.1. විශ්‍රාම වැටුප් අයදුම්පත්‍රය අනුමත කිරීමෙන් පසු විශ්‍රාම වැටුප සක්‍රිය කිරීම සඳහා සියලු විශ්‍රාමිකයන් විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවේ දී පැවැත්වෙන සම්මුඛ පරීක්ෂණයකට කැඳවනු ලබයි. එහිදී විශ්‍රාමිකයාගේ අනන්‍යතාවය තහවුරු කර ගෙන ඔහුගේ/ඇයගේ ඇඟිලි සළකුණු විශ්‍රාම වැටුප් පද්ධතිය තුළ ලියාපදිංචි කිරීම, විශ්‍රාමිකයාගෙන් යැපෙන්නන්ගේ තොරතුරු තහවුරු කරගෙන විශ්‍රාම වැටුප් හිමිකම් පත්‍රය නිකුත් කිරීම හා විශ්‍රාමික හැඳුනුම්පත නිකුත් කිරීම සිදු කෙරේ.

1.2. සම්මුඛ පරීක්ෂණය සඳහා පැමිණීමේ දී විශ්‍රාමිකයා විසින් රැගෙන ආ යුතු පහත ලිපි ලේඛන ලැයිස්තුව ඇතුළත් උපදෙස් පත්‍රිකාව, ඔහු/ඇය අවසන් වරට සේවය කරන ආයතනය විසින් විශ්‍රාම වැටුප් අයදුම්පත්‍රය මුද්‍රණය කර ගැනීමේ දී ලැබෙන අතර එය විශ්‍රාමිකයා වෙත ලබාදෙන ලෙසට විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව විසින් සියලුම රාජ්‍ය ආයතන දැනුවත් කර ඇත.

i. නිලධාරියාගේ ජාතික හැඳුනුම්පත, එහි පිටපතක් හා උප්පැන්න සහතිකයේ මුල් පිටපත
ii. කලත්‍රයාගේ ජාතික හැඳුනුම්පතෙහි පිටපතක් හා උප්පැන්න සහතිකයේ මුල් පිටපත
iii. වැන්දඹු අනත්දරු කාඩ්පත
iv. විවාහ සහතිකයේ මුල් පිටපත
v. කලත්‍රයාගෙන් දික්කසාද වී ඇත්නම් දික්කසාද නියත තීන්දුවේ මුල් පිටපත
vi. කලත්‍රයා මියගොස් ඇත්නම් මරණ සහතිකයේ මුල් පිටපත
vii. වයස අවුරුදු 26ට අඩු දරුවන්ගේ උප්පැන්න සහතිකවල මුල් පිටපත්
viii. නම්වල වෙනසක් පවතීනම්, ඒ බව සනාථ කිරීමට දිවුරුම් ප්‍රකාශ හෝ වෙනත් සුදුසු ලේඛන
ix. ආබාධිත දරුවන් සිටී නම් ඔවුන්ගේ ආබාධිත තත්ත්වය උපතේ දී හෝ වයස අවුරුදු 26ට පෙර සිදුවූ බවට සනාථ කිරීමට අවශ්‍ය වෛද්‍ය වාර්තා, සායනික තොරතුරු හා රෝග නිධානය පිළිබඳ වාර්තා, පෝස්ට්කාඩ් ප්‍රමාණයේ (සම්පූර්ණ) වර්ණ ඡායාරූපයක්, සෞඛ්‍ය 307 වාර්තාව හා උප්පැන්න සහතිකවල මුල් පිටපත්
x. කලත්‍රයාගේ පාස්පෝට් ප්‍රමාණයේ වර්ණ ඡායාරූප 1 ක්

1.3. එහෙත් ඇතැම් රාජ්‍ය ආයතන විසින් විශ්‍රාමිකයා දැනුවත් නොකිරීම නිසා හෝ විශ්‍රාමිකයාගේ නොදැනුවත්කමින් හෝ ඔවුන් රැගෙන එනු ලබන ලිපි ලේඛනවල බොහෝ අඩුපාඩු පවතී. එවිට සම්මුඛ පරීක්ෂණයේ දී නිකුත් කරන විශ්‍රාම වැටුප් හිමිකම් පත්‍රයේ "වැන්දඹු අනත්දරු හිමිකම තහවුරු කර නොමැත" යනුවෙන් මුද්‍රිතව සටහන් කර නිකුත් කරයි. එමගින්

මාළිගාවත්ත, කොළඹ 10. மாளிகாவத்தை கொழும்பு 10. Maligawatta, Colombo 10.
Hot line: 1970, Direct line: 2209800, Fax: 2342078, Email: info@pensions.gov.lk, Web: www.pensions.gov.lk

විශ්‍රාමිකයාගේ යැපෙන්නන් වෙත වැන්දඹු අනත්දරු හිමිකම අහිමිවීමක් සිදු නොවේ. එම අඩුපාඩු ලේඛන ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ පවතින තම විශ්‍රාම වැටුප් ලිපිගොනුවට ඇතුළත් කර තබන ලෙස සම්මුඛ පරීක්ෂණයේ දී විශ්‍රාමිකයා දැනුවත් කරනු ලබයි.

1.4. ඒ අනුව යම් විශ්‍රාමිකයෙකු ඉහත 1.2 ඡේදය යටතේ සඳහන් ලේඛන ඔබ වෙත ඉදිරිපත් කළහොත් එම ලේඛන විශ්‍රාමිකයාගේ විශ්‍රාම වැටුප් ලිපිගොනුවට ඇතුළත් කිරීමට කටයුතු කළ යුතුය.

**2. නිවාඩු දුම්රිය බලපත්‍ර ක්‍රමයේ ලියාපදිංචිය.**

නව විශ්‍රාමිකයෙකුගේ විශ්‍රාම වැටුප් ලිපිගොනුවක් ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙත ලැබුණු පසු විශ්‍රාමිකයා ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙත කැඳවා අනන්‍යතාවය තහවුරු කරගෙන මාර්ගගතව දුම්රිය බලපත්‍ර ක්‍රමයේ ලියාපදිංචියට කටයුතු කළ යුතුය.

**3. ජීවිත සහතික ලබා ගැනීම.**

3.1. මුදල් රෙගුලාසි 270 හා විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහයේ 41 වගන්තිය අනුව විශ්‍රාම වැටුප අදාළ විශ්‍රාමිකයාටම ගෙවන බවට තහවුරු කර ගැනීමට වර්ෂිකව විශ්‍රාමික ජීවිත සහතිකය ලබා ගැනේ.

3.2. වාර්ෂිකව ජීවිත සහතිකය සම්පූර්ණ කර ග්‍රාම නිලධාරි හරහා ලබාදීම හෝ ඇඟිලි සලකුණ හරහා ජීවිත සහතිකය ලබාදීම සම්බන්ධයෙන් නව විශ්‍රාමිකයන් දැනුවත් කිරීමට කටයුතු කළ යුතුය.

3.3. කිසියම් වර්ෂයකට අදාළව ජීවිත සහතිකය දත්ත පද්ධතියේ යාවත්කාලීන කිරීමේ දී ජීවිත සහතිකය ලද දිනය ලෙස එම අදාළ වර්ෂයේ දිනයක් ඇතුළත් විය යුතුය.

3.4. ඇඟිලි සලකුණු මඟින් ජීවිත සහතිකය ලබා දීමේදී ඇඟිලි සලකුණු තැබීම අදාළ වර්ෂයේදීම සිදු කළ යුතුය. (උදා- 2023 වර්ෂයට අදාළව නම් 2023.01.01 හෝ පසු දිනකදී)

3.5. පුද්ගලයෙකු මාස 03 කට වැඩි කාලයක් අදාළ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයෙන් පිට ගත කරන්නේ නම් එම විශ්‍රාම වැටුප් ගොනුව අදාළ පුද්ගලයා නැවතී සිටින ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට යැවීමට කටයුතු කළ යුතු ය.

3.6. නාවික කටයුතු සඳහා විදේශගත වීමේ දී නාවික කටයුතු පිළිබඳ ලේකම් කාර්යාලය හරහා හෝ විදේශයන්හි පිහිටි ශ්‍රී ලංකා විදේශ දූත මණ්ඩල කාර්යාලයක් හරහා වාර්ෂිකව ජීවිත සහතිකයක් ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතු ය.

3.7. වසර දෙකකට වඩා වැඩි කාලයක් සඳහා විදේශගත විශ්‍රාමිකයන්ගේ හා වෙනත් රටක පුරවැසිභාවය හෝ ද්විත්ව පුරවැසිභාවය හිමි විශ්‍රාමිකයන්ගේ විශ්‍රාම වැටුප් ලිපිගොනු විශ්‍රාම වැටුප් චක්‍රලේඛ 01/2018 අනුව වහාම ප්‍රධාන කාර්යාලයට ලැබීම සැලැස්විය යුතුය.

**ඒ. ජගත් ඩී. ඩයස්**
විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්